**හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිල කැඳවීමකින් හෝ ගිවිසුම් ගතවීමකින් තොරව පරිගණක උපාංග මිළදී ගැනීමේ අපේක්ෂාවෙන් රු.954,925 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව 2023 වර්ෂයේ වැය කර තිබුණු එකතුව රු.520,373 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් තුළ ඇතුළත් කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි වටිනාකම හඳුනාගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ නිකුත් කළ ආයුර්වේද ඖෂධ රු.314,723 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.2 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ'නල් සටහන් 07 ක් මගින් රු.28,418,523 ක ණයගැති, ණයහිමි හා වරිපනම් ශේෂ ගිණුම්වලින් කපාහැර තිබුණද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | කර්මාන්ත ණය ගැතියන් හා කර්මාන්ත ණය හිමියන් සඳහා නිවැරදිව ශේෂ හඳුනාගෙන ඉදිරි වර්ෂයේ ගිණුම තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව | කපා හැරීම් සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,623,025 ක් වටිනා ගිණුම් ශේෂ 5 ක් උපලේඛන සහ වැය විස්තර ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | මෙම ශේෂයන් තුළ ඉදිරි වර්ෂවල සිට පැවත එන ශේෂ නොගැලපීම් පවතින බැවින් එය ඉදිරියේදී නිරවුල් කර නිවැරදි උපලේඛන සකස් කරන බව | ලේඛන හා උපලේඛන පිළියෙල කර පවත්වා ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අතුරු ව්‍යවස්ථා<br>------------------- | | | |
| (i) | 2011 ඔක්තෝබර් 06 දින අංක 1726/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකළ කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | බල ප්‍රදේශය තුළ වාහන නවතා තැබීමට අනුමත ස්ථාන 41 ක් හඳුනාගෙන ගැසට් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටත් වාහන නවතා තැබීමේ ගාස්තු අය කර නොතිබුණි. | නව ගැසට් පත්‍රයන් මගින් ත්‍රී රෝද නැවතුම් පොලවල් 32 ක් ගැසට් කර පවත්වාගෙන යන බව | ගාස්තු අය කිරීමට පියවරගත යුතුය. |
| (ii) | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක xxxix දරන අතුරු ව්‍යවස්ථාව | ප්‍රදර්ශනය කරන දැන්වීම් පුවරු සභාපතිවරයා අනුමත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ප්‍රචාරක පුවරු 98 ක් සඳහා රු .166,684 ක ගාස්තු අයකරගෙන නොතිබුණි. | අදාළ වෙළඳ ආයතන දැනුවත් කර මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව | ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ
------------------------

| | | | |
|---|---|---|---|
| 1988 මැයි 17 දිනැති අංක 1988 / 22 දරණ චක්‍රලේඛය | 2013 වර්ෂයෙන් පසුව වරිපනම් දේපල තක්සේරු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,328,001 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.876,978 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,294,300 | 5,288,672 | 5,478,464 | 1,760,691 | 4,273,000 | 4,729,785 | 2,522,152 | 1,950,481 |
| (ii) | කඩ කුලී | 6,132,600 | 2,135,839 | 2,218,859 | 2,400,253 | 5,441,900 | 2,138,077 | 3,789,740 | 2,483,273 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 866,200 | 2,327,862 | 2,327,862 | - | 1,160,200 | 1,939,077 | 1,939,082 | - |
| (iv) | වෙනත් ආදායම් | 81,723,134 | 17,970,936 | 21,212,496 | 4,607,719 | 69,731,900 | - | 62,381,511 | 7,849,279 |
| | | 93,016,234 | 27,723,309 | 31,237,681 | 8,768,663 | 80,607,000 | 8,806,939 | 70,632,485 | 12,283,033 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

**විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

(අ) වරිපනම් හා බදු
-------------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති වරිපනම් බදු නොගෙවා ඇති හිඟ ආදායම් රැස්
රු.1,136,528 ක වරිපනම් බදු හිඟ ශේෂය තුළ පුද්ගලයන් 10 දෙනෙකු සඳහා කරගත යුතුය.

| | | | |
|---|---|---|---|
| | වසර 01 ත් 05 ත් අතර කාලයකට අදාළ වරිපනම් පරිශ්‍ර 155 කින් රු.294,582 ක් හා වසර 05 ට වැඩි වරිපනම් පරිශ්‍ර 72 කින් රු.304,217 ක් අයවිය යුතු ශේෂ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ මුදල් අයකර නොතිබුණි. | රිට් ආඥාවක් නිකුත් කිරිම සඳහා අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතින බව | |
| (ආ) | කුලී<br>-----<br>2020 වර්ෂයේ සිට හිඟව පවතින කඩ කුලී රු.2,214,532 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටද අයකරගෙන නොතිබුණි. | සන්තකය පවරා ගැනීම සඳහා ලිපිගොනු පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට භාර දී ඇති බව | - එම - |
| (ඇ) | බලපත්‍ර ගාස්තු<br>---------------<br>සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත 14 කට අදාලව ස්ථාන 28කින් එකතුව රු.28,000 ක බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු අය කර නොතිබුණි . | බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කරන බව | - එම - |
| (ඈ) | වෙනත් ආදායම්<br>------------------<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.75,375 ක හිඟ ජල ගාස්තු අය කර ගෙන නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව | හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>-------------------------------<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 396,619 ක් හා මුද්දර ගාස්තු රු.4,211,100 ක් විය. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව | හිඟ ආදායම ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ස්ථාන මාරු වී පැමිණි වසර 01 ත් වසර 04 ත් අතර කාලයක් ගත වු නිළධාරීන් දෙදෙනකුගේ රු.380,420 ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන්ගේ පරස්පරතාවක් පවතින බැවින් එය නිරවුල් කිරීමට නොහැකි වූ බව | නොසැසඳීම් සොයා බලා නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභා බල ප්‍රදේශයේ පිහිටි පොදු වැසිකිළි 03 ක් හා රථ ගාලක් ඇසළ පෙරහැර කාලය තුළ පමණක් බදුදීමට කටයුතු කර ඇතත් වර්ෂයේ ඉතිරි කාලය සඳහා එම දේපල බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් සභාවට ලබා ගත හැකි ආදායමක් අහිමි වී තිබුණි. | ඉදිරියේදී සභාවට ආදායම් මාර්ගයක් වන සේ කටයුතු කරන බව | ටෙන්ඩර් කර පවරා ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශය තුළ පවතින පොදු සුසාන භූමි 76 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සුසාන භූමි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව | ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ පිහිටි ආයුර්වේද, ආදාහනාගර, පුස්තකාල, පෙර පසැල් වැසිකිළි යනාදි ගොඩනැඟිලි 10 ක් රිකිල්ලගස්කඩ කඩ කාමර 10 ක් හා රහතුන්ගොඩ පොල භූමියේ ගොඩනැගිලි නිසි පරිදි නඩත්තුවක් හා අළුත්වැඩියාවකින් තොරව විනාශවීමට ඉඩහැර තිබුණ අතර ඇතැම් ගොඩනැගිලි හා ඉඩම් සඳහා වැට මායිම් යොදා ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | සභාවේ මුදල් ප්‍රතිපාදන ප්‍රමණවත් නොවන බැවින් මුදල් ප්‍රතිපාදන සපයාගෙන අළුත්වැඩියා කරන බව | ආරක්ෂාව තහවුරු කළ යුතු අතර ගොඩනැඟිලි අළුත්වැඩියා කර නඩත්තු කර ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රිකිල්ලගස්කඩ ක්‍රීඩාපිටිය තුළ 33'x 21' ප්‍රමාණයේ ක්‍රීඩාගාරයක් ඉදිකිරීමට කොන්ක්‍රීට් කනු යොදා යකඩ රාමුව ඉදිකර කර තිබුණද, එහි වහලය ඉදිකර නොතිබීම හේතුවෙන් භාවිතා කළ නොහැකිව පැවති අතර යකඩ රාමුව දිරාපත්වීමේ අවදානමක් පැවතුණි. | මෙම ස්ථානයක නඩත්තු කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලැබුණහොත් ඉදිකිරීම් ඉටු කරන බව | ඉදිකිරීම් නිමකර භාවිතයට ගත යුතුය. |
| (ඈ) | දීගලහින්න ආදාහනාගාර ඉඩමේ වැට මායිම් සලකුණු කර නොමැති අතර ආදාහනාගාරයේ කොන්ක්‍රීට් තට්ටුවෙහි කම්බි දිරාපත් වෙමින් පැවතුණි. | ඉදිරියේදී අළුත්වැඩියා කරන බව | සභා දේපල ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | ඉඩම් හා ගොඩනැගිලි ඒකක 05 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් තක්සේරු කර ගිණුම් ගත කරන බව | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ මධ්‍යම පළාත් වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව රු.2,600,000 ක් වැයකර කොළපතන ඇල්ල සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකළ වැසිකිලිය, විදුලිය සපයා නොතිබීම, පිවිසුම් මාර්ගයක් නොමැති වීම ආදී හේතු මත භාවිතයෙන් තොරව වසා දමා තිබුණි. | දැනට ජල පහසුකම් ලබාදී ඇති අතර විදුලිය ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බව. | අදාළ අඩු පාඩු සකස් කර භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කළ යුතුය. |

**3. 4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අනුමත කාර්ය මණ්ඩල අනුව තනතුරු 17 ක පුරප්පාඩු 38 හා තනතුරු 01 ක අතිරික්ත 09 ක් පැවතුණි. වසර 05 කට වැඩිකාලයක සිට ලේකම් තනතුර, වැඩ පරිපාලක, පෙර පාසල් ගුරු තනතුරු, ආදාහනාගාර ක්‍රියාකරු හා බැකෝ ලෝඩර් ක්‍රියාකරු තනතුරුද පුරප්පාඩුව පැවතුණි. ආයුර්වේද වෛද්‍යවරයෙකු නොමැති වීම හේතුවෙන් හඟුරන්කෙත සහ ඉඩම්පිටිය ආයුර්වේද මධ්‍යස්ථානය එක් දිනක් පමණක් රෝගී සත්කාර සේවාව සඳහා විවෘතව පැවතුණි. | ස්ථිර වෛද්‍ය වරයෙක් පලාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවට අනුයුක්ත කර නොමැති බව | මහජන සේවාවන් නිසි ලෙස ඉටු කිරීමට පියවර ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳසැල් හඳුනා ගැනීම, පරිසර ගැටළු හඳුනා ගැනීම, ආහාර පනත හා නාගරික සනීපාරක්ෂක කටයුතු අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරීම, පුහුණු වැඩසටහන් සැලැසුම් කිරීම, හා බලපත්‍ර නොගත් වෙළඳසැල් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීම ඇතුළු කාර්යයන් ඉටුකරන බව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වුවද, එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | බල ප්‍රදේශයේ පිටත් වන මහජනතාවගේ සුව පහසුව පිණිස සුභසාධක වැඩසටහන් ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාවට නංවන ලද අතර 2023 වර්ෂයේදී ආදායම් මූලාශ්‍ර හඳුනා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කර ඇති බව. | ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට -3 සිට සියයට 36 දක්වාද වියදම් විෂයයන් 06 ක සියයට 03 සිට සියයට 32 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලනකාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඇස්තමේන්තු පරිදි ක්‍රියා කිරීමට නොහැකි වූ බව | ඇස්තමේන්තු පරිදි කටයුතු කිරීමට පියවර ගත යුතුය. |